**වයඹ පළාත් සභා පාසල් වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය 2024/07/12**

උක්ත තනතුරට බඳවා ගැනීම සඳහා වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි, ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය, 2024/07/12 දින වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ දී පැවැත්වීමට නියමිතව ඇත.

02. ඒ අනුව, මෙම වෙබ් අඩවියේ පළකර ඇති ප්‍රකාශ පත්‍රය සම්පූර්ණ කරගෙන පහත සඳහන් ලේඛනවල මුල් පිටපත් හා ඡායා පිටපත් කට්ටල දෙක බැගින් ද රැගෙන නියමිත වේලාවට සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින ලෙස කාරුණිකව දන්වමි.

03. සියලු ඡායා පිටපත්වල "මුල් පිටපතේ සත්‍ය පිටපතක් බවට සහතික කරමි" ලෙස සඳහන් කර ඔබ විසින් අත්සන් කළ යුතුය.

04. රැගෙන ආ යුතු ලේඛන

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය.
II. උප්පැන්න සහතිකය
III. අ.පො.ස(සා/පෙළ) සහතිකය
IV. අ.පො.ස (උසස් පෙළ) සහතිකය
V. අධ්‍යාපනවේදී උපාධි සහතිකය (වලංගු දිනය සහිත විස්තරාත්මක සහතිකය අත්‍යාවශ්‍ය වේ)
VI. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් DS4 ආකෘතියෙන් නිකුත් කරනු ලබන ග්‍රාම නිලධාරි සහතිකය. (අයදුම්කරු වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ යුතු අතර ග්‍රාම නිලධාරී සහතිකයෙන් වසර තුනක පදිංචිය තහවුරු නොවන අවස්ථාවලදී කලත්‍රයා වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු නම් කලත්‍රයාගේ පදංචි සහතිකය සමග විවාහ සහතිකය මගින් හෝ අයදුම්කරු වයඹ පළාතේම වෙනත් ග්‍රාම නිලධාරී වසමක පදිංචිව සිටියේනම් පෙර පදිංචිය හැරයාම පිළිබඳ අදාල ග්‍රාම නිලධාරී විසින් ලබා දෙන ලිපියක් මගින් හෝ වයඹ පළාත තුළ පූර්වාසන්න වසර තුනක ස්ථිර පදිංචිය සනාථ කළ හැකිය)
VII. උප්පැන්න සහතිකය, හැඳුනුම්පත හෝ අධ්‍යාපන සහතිකවල සඳහන් නම් අතර කිසියම් වෙනසක් ඇත්නම් ඒ සඳහා දිවුරුම් ප්‍රකාශය.

**ඉතා වැදගත්:** අයදුම්පත් කැඳවා ඇත්තේ සිව් අවුරුදු අධ්‍යාපනවේදී උපාධියක් සහිත උපාධිධාරීන්ගෙන් වන බැවින් වසර හතරක අධ්‍යාපනවේදී උපාධියක් හදාරා ඇති බවට සනාථ කරන විධිමත් ලේඛන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. මෙම තහවුරුව අදාල විශ්ව විද්‍යාලය හෝ උපාධි පිරිනැමීමේ ආයතනය විසින්ම විධිමත්ව ලිඛිතව ලබා දී තිබිය යුතුය. එමෙන්ම විදේශ විශ්ව විද්‍යාලවලින් උපාධි ලබාගත් අයදුම්කරුවන්ගේ උපාධිය ලබාගත් විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් බවට නිකුත් කළ ලිපියක් තිබීම අනිවාර්ය වේ.

04. මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පමණක් පත්වීමක් ලැබීමට අනිවාර්ය හිමිකමක් නොවන බව සැලකිය යුතු වන අතර මේ සඳහා ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලබන බවද කාරුණිකව දන්වමි.

**ඊ.එම්.පී. ඒකනායක,**
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.